# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

අංක. 9,665—1947ක්වූ පෙබරවාරි මස 7 වෙනි දිනවූ සිකුරාදා.


## Part. IV.—හතරවෙනි කාණ්ඩය.

### ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීම.

ආණ්ඩුවේ කාර්යක්තකට; එනම්:—කඩුගන්නාවේ කානුවක් තැනීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "203 පරිච්ඡේදයේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" පස්වෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුම්ාණන්වහන්සේගේ බලය පිට පලාත් පාලක විධායක මණ්ඩලයෙන් කළඅකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩමනම්:—

සිතියමේ අංක. A 1,125. ගම—කඩුගන්නාවේ නගර සභාවට ඇතුළත්ය.

| අංක. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත, | ඇ. රූ. ප. |
|---|---|---|---|---|---|
| 1 | අලුත්කඩේවත්ත නොහොත් පල්ලෙවත්ත, කොළඹ-නුවර පාරේ අංක. 244–248A දරණ ඉඩමින් කොටසක්මේ | වත්ත | (1) කොටබෝගෙදර සිරිවර්ධනපෙඩිගෙදර සමරු, (2) සතු පෙඩිංගෙදර සුමණසේන, (3) එම අන්ද්‍රිස්, (4) එම පින්චි උක්කු, (5) එම ගුණසේන, (6) එම සිලින්දු. (7) එම මැනිකා, (8) එම හොරනැලී, (9) එම ලසිනා වන කඩුගන්නාවේ පදිංචි අයගේ | 0 | 0 1·02 |

එබැවින් ඉඩම අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හයවෙනි වගන්තියේ හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වම් 1947ක්වූ මාර්තු මස 7වෙනි දින පෙරවරු 10යේ කානිසමට මහනුවර කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒව ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වම් 1947ක්වූ ජනවාරි මස 30වෙනි දින මහනුවර කච්චේරියේදීය.

එච්. සී. ගුණවර්ධන,
ම. දි. ආණ්ඩුවේ උප ඒජන්ත වමහ

---

ආණ්ඩුවේ කාර්යක්තකට, එනම්:—පඹිවවෙල ගමේ සුසානභූමියක් පිහිටුවීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "203 පරිච්ඡේදයේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" පස්වෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට පලාත් පාලක කාරක සභාවේ නියෝගය පරිදි උතුම්ාණන්වහන්සේගෙන් තිසිඅකාර මට අණ ලැබ තිබේ; ඒ ඉඩමනම්:—

සිතියමේ අංක. A 1,161. ගම—පඹිවවෙල.

| අංක. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත, ඇ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | ලිදමුලගෙදරවත්ත .. | අවුරුදු 4–30 දක්වා වයස්වූ පොල්ගස් 6ක්ද, අවුරුදු 5–15 පමණවූ පුවක්ගස් 48ක්ද, අවුරුදු 10ක්වූ කිතුල්ගහක්ද, අවුරුදු 5–25ක් පමණ වයස්වූ කොස්ගස් 16ක්ද, අවුරුදු 10ක්වූ සාදික්කාගහක් සහ අවුරුදු 8ක්වූ එන්සාල් පඳුරකින් යුත් වත්ත | මාතලේ පඹිවව පදිංචි ඇම්. ඇස්. වී. සින්නසියා | 0 0 12·7 |

එබැවින් ඉඩම අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හයවෙනි වගන්තියේ හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වම් 1947ක්වූ මාර්තු මස 3වෙනි දින පෙරවරු 11 කානිසමට මාතලේ කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒව ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

මම 1947ක්වූ පෙබරවාරි මස 3වෙනි දින මාතලේ කච්චේරියේදීය.

ඩී. ඇල්. විරසිංහ,
ආණ්ඩුවේ උප ඒජන්ත වමහ.

---

ආණ්ඩුවේ කාර්යක්තකට, එනම්:—ගම්සභාපාරක් පළල්කිරීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "203වෙනි පරිච්ඡේදයේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" පස්වෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුම්ාණන්වහන්සේගේ නියමය පරිදි පලාත් පාලන විධායක මණ්ඩලය මගින් තිසිඅකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩම නම්:—

සිතියමේ අංක. A 883. ගම—ලුනුවිල.

| අංක. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත; ඇ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | ගම්සභාපාර .. | ගම්සභාපාරකින් කොටසක් (කලින් අවුරුදු 30–50 අතරවූ පොල්ගස් 29ක්ද, අවුරුදු 3ක්වූ පොල්පැල 6ක්ද තිබූ බව කියන පොල් ඉඩම | (1) ඔබිලිව්. හුසේ ප්‍රනාන්දු, බස්නාහිර නාහිත මඩම, (2) ලුනුවිල පදිංචි අම්බරෝසියගේ දියෝනිස් ප්‍රනාන්දු සහ (3) ඉශිස්තිනා මරිය පින්ටෝ | 0 0 5·2 |
| 2 | එම .. | ගම්සභාපාරකින් කොටසක් .. | එම .. | .. 0 0 1·3 |
| 3 | එම .. | එම .. | ලුනුවිල ආර්. ජෝන් පෙරේරා .. | .. 0 0 10·8 |

එබැවින් ඉඩම අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හයවෙනි වගන්තියේ නියමකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ හැමදෙනාම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1947ක්වූ මාර්තු මස 8වෙනි දින පෙරවරු 9.30ට කතිගම්ව මාරම්ල අදුකම්පාලක නිලධාරීතුමාගේ කාර්යාලයේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අයුරකින් අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒවා ඇත්තාවූ කවුරුන්ගේ අයිතියකටද තොරතුරුත කියා දිවිත්ව ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1947ක්වූ ජනවාරි මස 29වෙනි දින
පුත්තලම් කච්චේරියේදීය.

ඩබ්ලිව්. ඒ. ද සිල්වා,
ආණ්ඩුවේ උප ඒජන්ත මහතා.

---

## සුප්‍රීම උසාවියේ දැන්වීම.

ශ්‍රී ලංකාවිපගේ ගරුකටයුතු උතුම්වූ සුප්‍රීම් උසාවියෙන් මට ලැබී තිබෙන අණවක බලය කරණකොටගෙණ මෙයින් ප්‍රකාශ කරන්නේනම් යාපනය, මූලතිව් සහ මන්නාර් දිසාවේ ක්‍රිමිනල් නඩු විභාගය වර්ෂ 1947ක්වූ පෙබරවාරි මස 24වෙනි සඳුදින පෙරවරු 11 පැය පටන් යාපනේ නගර සභාවේ තිබෙන නඩු ශාලාවේ පවත්වන්ට යෙදෙනවා ඇත. එහි යම්කාරණ ඇතුව සිටින හැමදෙනාම යටකී ස්ථානයට යටකී වේලාවට ඇවිත් පෙණීසිටින්ට ඕනෑවින් ඇර අවසර ඉල්ලා ලබාගෙණ මිස එයින් පිටතට යන්ට නුසුදුසු බවත් මෙයින් හැමදෙනාටම දන්වන්නෙමි.

සී. මුරේසිංහම්,
උතුරු පලාතේ පිස්කල් මහතා.

වර්ෂ 1947ක්වූ ජනවාරි මස 28වෙනි දින
යාපනේ පිස්කල් කන්තෝරුවේදීය.

## දැන්වීමයි.

බස්නාහිර පලාතේ කොළඹ දිස්ත්‍රික්කයේ සිඹාතල පිස්සුබල්ලු රෝගයෙන් අනතුරු දනව ඇති බව "පිස්සුබල්ලු රෝගය පිළිබඳ ආඥාපණතයි" නම්කරනලද ආඥාපණතේ ( 33 පරිච්ඡේදය) 11 වන වගන්තියේ ප්‍රකාර මට ලැබී තිබෙන බලය පරිදි මෙයින් ප්‍රකාශකරමි. බැඳ නොසිටිනා හෝ කොගතතුන් විසින් ලනුවක හෝ දම්වැලක ආධාරයෙන් ගෙනයනු නොලබන යම්කිසි බල්ලෙක් ප්‍රසිද්ධ ස්ථානයකදී නොහොත් පාරකදී සම්භවුවහොත් ඌ විනාශකරදමනු ලැබේ.

වී. කුමාරස්වාමි,
බස්නාහිර පලාතේ දිසාපතිතුමා.

වර්ෂ 1947ක්වූ ජනවාරි මස 27වෙනි දින
කොළඹ කච්චේරියේදීය.

PRINTED AT THE CEYLON GOVERNMENT PRESS COLOMBO